නිර්මාණ Nirmana

මියගිය අතීතය

තම හම පරණ වූ විට නයි එය දනිතී
හැව මෙන් එය අතැර ගස් දෙබලක දමතී
සැරසී අළුත් හමකින් වනයට ඇදෙතී
අතහැර දමන ලද හැව වෙත යළි නොයතී

හේමන්තයේදී හැම අවුරුද්දෙම ලබන
ඈ තට්ටුවෙ රිකිලි එකි නෙක බිම හලන
මුවෝ ගෝනු ඒ ගැන පසු නොම තැවෙන
ඉවසති වැඩෙන තුරු නව ඈ යළි හැදෙන

හේමන්තයේදි එන හිම පතනයට පෙර
හැම කොළයක් ම වියලා බිම පතිත කර
එන තුරු වසන්තය කොළ මල් පලින් බර
ඉවසා සිටී ගස් වැල් සිත් තැවුල් තොර

තලු මර මරා කෑ බී රසවත් අහර
දුහදය අම්හිරිය කාලය යන අතර
මළ මු එබඳු දැමු පසු සිරුරෙන් බැහැර
නොසිතේ එයින් යළි සත්‍යපන්නට සිරුර

අළුයම හෙළන ලද කුණු කෙළ පිඩ බිමට
නැවතත් ගිලගන්න රිසියක් නැති සිතට
මියගිය අතීතයෙ මළ මතකයෙ ගැහැට
මහමෙර වගෙ බරක් කරගන්නේ කුමට

මියගිය අතීතය යළි ආපසු නොඑන
පණගැන්විය නොහැක වෙර දැරුවත් කුමන
පසුතැවුනාට ඒ ගැන දකිමින් සිහින
යළි පණ නොගැන්වේ එය වළ දැමූ සොහොන

♦ **මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම**
Harrow UK

ඉඳුරුවෙ නෙළුම් පොකුණට පණ ලැබේවා !

කොස්ගොඩ ඉඳුරුවට මායිම් ලකුණු තියා
තිබුණා නෙළුම් පොකුණක් ඉතිහසෙහි ලියා
එහි තිබූ සුවඳ හැම ගමටම විසිර ගියා
එම සුන්දර දසුන නැත අද දකින නියා

ගාලු කොළඹ පාරේ යන එන අයටත්
නැග දුම්රියකළු මේ අත යන හැමටත්
දැකුමට නෙළුම් විල සුබ දසුනකි කවදත්
එය ඉඳුරුවට මෙන් ලකටම විය වැදගත්

අක්කර දහය දොළහක වප සරියක්ය
පිපුණේ එදා එහි සියපත් දහසක්ය
දිය නා ලැබුවෙ ගම හැමදෙන සිහිලක්ය
කෝ අද එම පොකුණ එහි ගොඩ පොළවක්ය

වගකිව යුතු අයගෙ ඇස් දෙක ඇරේවා
සියපත් වල සුවඳ දස දෙස හැමේවා
ඉඳුරුවෙ නෙළුම් පොකුණට පණ ලැබේවා
ඉර හඳ වගේ මෙය බැබළී තිබේවා

♦ **විලියම් මහඅරඹගේ**
මහඉඳුරුව Sri Lanka

හන්තාන පාළු නෑ

හන්තාන කඳු මුදුන මත හැපී පාව එන
නුඹ නැතත් නුඹේ සුසුම් සුවඳ දෙන අපූරුව
ගෙවා දැමූ යෞවනේ නුඹේ සැමරුම් අතර
ඇසෙන්නේ ගී හඬකි නුඹේ හසරැල් නොවන

පවන් රැල් නෙතු සලා මට කෙරූ ඇරයුමට
කුසුම් පෙති සුවඳ දී හද සැලූ නියාවට
නුඹේ හඬ නුවර නික්මවා යන විට සබඳ
පැමිණියෙමි මම මගේ කවි සිතින් වඩාගෙන

නෙතු පියෙන හැම වෙලේ නුඹේ හඬ ඇසෙන විට
නුඹත් උණි නම් මෙහිම කොයි තරම් අපූරුද
හන්තාන පාළු නෑ එසේ වී නම් සබඳ
මගෙ හිතට තව ළඟින් දැනෙයි එහෙනම් නුඹව

♦ **උපෙකලා භාග්‍යානි අතුකෝරාළ**
දොම්පෙ Sri Lanka



උක් කපන මල්ලියේ !

වක්වූ පිහියක් සුරතෙහි රැඳුණා
උක් පඳුරින් පඳුරට පා ඇදුණා
මොහොතක් දිව්යේ අග හිඟ සිඳුණා
නුඹ දැක මා සිත සෙනෙහස බැඳුණා

නව හෙට දවසක පැතුමක් විලසේ
ළා හිරු එක්කම දවසට සැරසේ
සැඩ හිරු මැද දැනෙනා සා පවසේ
විඩා නිවා උක් පැණි බී සැනසේ

ඇහේ හැපෙන තද අව්රැස් මාලා
ඩා බිඳු මුතු ලෙස හැඩ කර වාලා
සෝවුරු හට පිය සෙනෙහස පාලා
මගෙ ලක් මැණිට දිරි දෙන ලීලා

පාසැල් ගමනට අත වනනා ලෙද
එදා වේල සරිකරනට යන සඳ
දහසක් සිතුවිලි මල් සුවඳක් විඳ
නුඹෙ මුදු සිත සැනසුම් සුව රැඳ ණිද

දෑතෙහි කර ගැට රිදුම් සදන විට
උණුසුම් නල රැළි ඇහ දැවටෙන විට
ඒ අතරින් මුව සිනා ඇදෙන විට
සැනසුම ළං වේවිද නුඹෙ දිවි යට

ගත රැඳි ඩා මුතු වී දිදුලද් දෙන්
අවුරැස් මාලා සිහිල සඳද් දෙන්
සිතේ උපන් පැතුමන් ඉටු වෙද් දෙන්
හෙට හිරු පායා සිනා සලද් දෙන්

♦ **දුලාංජලි සිරිවර්ධන**
නිති පිධය
***කොළඹ විශ්වවිද්‍යාලය* Sri Lanka**

අප්පච්චි !

වැඩෙනා දිවිය මවකගෙ සෙනෙහස ඇතුව
නොදැනෙද අඩුව පිය සෙනෙහස ළඟ නැතුව
දස මස කුස දරා නොවැදුව මුත් අපව
සම කළ හැකිද පියවරු වෙන කාට තව

දහදුක් වින්දෙ ගිනි අව්වේ කුඹුරු කොටා
දහඩිඩිය හෙලුලුවෙ දරුවන්ගේ දියුණු වටා
දුටුවම වැරැද්දෙදි ඔබ දුන් දඬුව මටා
සෙනෙහස වැඩිඩිවුණා ඔබ ගැන තව මෙ මටා

යන එන මගේ ගහ පළවැළ නෙලා දිදී
ඔබගේ ලෝකයේ අප හට සතුට සැදී
පිය සෙනෙහසට කිරි එරුණේ නැතත් සිඳී
සඳ ඉල්ලුලුවත් හැකිනම් ඉන්නවද නොදී

සෙනෙහස මවගෙ මහමෙරටත් වැඩිඩි වී නම්
ඔබවත් එතැන තබනට මම සූදා නම්
කුස පුරවමින් රැකවරණය සැදුවා නම්
ඇයි බැරි පිතන්නට සම ලෙස මට එහෙ නම්

අම්මා නොමැති කල අප්පා කවර කල
ඒ හිස් වදන් මට අරුතක් නොමැත ඵල
ශක්තිය මගේ දිවියට දුන් පහන් සිල
රැකවරණයට ඔබමයි මට පිසුණු මල

මඩකර කුඹුර තනිවම ඔබ වපුර මිනා
දිව රෑ නොබල අපගේ බත සරි කරනා
ආවේ ගෙදර ගොම්මන් රෑ අඳුඳුර ගෙනා
තිබුණෙද ඉඩක් බලනට දරුවන්ගෙ සිනා

ලෙඩවූ දිනේ වෙද ඇඳුරන් ළඟට සොයා
අම්මට වැඩිය හයියෙන් ඔබ ඇවිද ගියා
මවගේ සෙනේ මා අබියස රඳව තියා
ජීවිත සටනටත් තනිවම දිවිවෙ ඔයා

මව් පදවියට පිය පදවිය සමව් යන්
හඳවත රුවා ඇති දරුදුක හෙළිව් යන්
පිය සෙනෙහසට ලොව කව් ගී ලියැව් යන්
එම සතුටින්ම පියතුම ඔබ රජව් යන්

♦ **විමලා යාපා** *(ඇඹිලිපිටිය)*
Nicosia Cyprus

වියෝවූ කිවිඳියට

ලංකාවිත්තියෙන් නිතරම මුණ ගැහුණා
හරබර හැඟුම් ඇති කවිපද රස පිරුණා
ප්‍රේමා අදිකාරී යන නම හද රැඳුණා
ප්‍රේමා මමත් ඔබ වෙත සෙනෙහස බැඳුණා

දැකලා නැතත් කිසි දින හැඳිනුවෙ නාමෙන්
ඇසුවා වියෝවූ බව සිට අස නීපෙන්
නැගුණා ඇහැට කඳුලක් ඔබ සිහි වීමෙන්
පිදුවා මලක් පුදසුන මත ඔබ නාමෙන්

ලංකාවිත්ති හෙළ හදවත් පුබුදු කර
ගෙන එයි ලොව වටා තොරතුරු එකතු කර
ප්‍රේමා අදිකාරී මැතිණිගෙ සෙනෙහෙ බර
කවි අදහස් රැඳුණි ඒ පත් පිටු අතර

දියමඳ් අනුව වෙන්ව් ගිය මුදු මෙවර
හමුවෙනු ඇත අපට ඔබ යළිමග සසර
කවිපද ගොතා එවරද අප පුබුදු කර
පියවර මනිනු මැන! නිවනට දුක් දුරැර

♦ ***ප්‍රේමා එස්. රූපසිංහ***
නුගේගොඩ Sri Lanka

ප්‍රාර්ථනා !

සන්සුන් සිතින් ලෝකය දෙස බලන්න යි
නිම්හිම් නොමැති බිහිසුණුබව නසන්න යි
සාමෙන් සමගියෙන් දියුණුව ලබන්න යි
මිතුදම් පිනිදියෙන් සිතුවිලි තෙමෙන්න යි

කඳුලට නිමාවකි එකමුතුකම බැඳුණ
සැමහට යහපතකි නිරතුරු දුක් විඳින
උතුරට දකුණ යා කොට අත්වැල් බඳින
ගමනට සවිය අපි වෙමු රුපු ඔද බිඳින

♦ ***එස් ඒ සමන්කුමාර***
කඩවලගෙදර Sri Lanka

උවැසියකගෙන් දියණියට

මේ සිල් ඇඳුමෙහි නූලක් ගානේ
සැකසූ ඇඳුමෙහි අහලක් ගානේ
පෝ දින සුරකින සිල් පද ගානේ
හැම දුක් ගිලිහී යේවා පවනේ

සහනට පුද කළ ඊවරයක් සේ
බලගතු කුසලය ඇත මහ මෙර සේ
එපිනෙන් පිරිපත දුරුව් තිර සේ
දියණිට සෙත් සිරි නිරතුරු සැල සේ

♦ ***ඔග්ලි ශ්‍රී වර්ණසිංහ***
මත්තෙගොඩ Sri Lanka

තවත් මඟියෙක් !

සෙනෙහේ වන්දනා ගමන
අතරමගක දී නැවතුණ
දෛවයෙ රුදු දෑත් අතර
ගිනිගත් සිතුවිලි සිරවුණ
ළබැඳි එකම වදනක් වත්
නොලැබ සරතැසින් ළතැවුණ
මතක පවුරු අතර රැඳුණ
පාළු සිතකි මා තනිවුණ

නුඹගේ පියවර හඬකින්
හදම තිගැස්සී ඇහැරුණ
අවසන් සෙනෙහස් බිඳුවත්
පුද දෙන්නට සිත සැරසුණ
විමතියකින් මදෙස බලා
විලසින් යන මග වැරදුණ
නුඹ ද තවත් මඟියෙක් වෙද
හදට ගොඩ වැදී පිටවුණ

♦ ***නදීරා රෝමිණි***
නල්ලපෙරුම

සරසවි ගිය පුතාට

අමතක කර පවුලේ ගින්න
ගත් පඩිපත නුඹට දීලා
වාසිටියට නුඹ යැව්වේ
මැරවරයෙක් කරන්න නොව

කඩු කිනිසි දැලිපිහි ගල්මුගුරු
නොවෙයි පුතේ උඹේ පෑන
විප්ලවයේ රාළ නොව
නුඹ තවමත් සිසුවෙක්ය

හෙට දිනට සින්න වෙයි
ගෙයි ඔප්පුව මුදලාලිට
කවදාද නුඹ එන්නේ
අරගෙන ඔය උපාධිය

♦ ***ප්‍රියන්ති අබේනායක***
Paris 10 France

හෙළ දරු වරුණ!

රට දැය සමය ගැන දකිමින් සුබ සිහින
එක් සිත් ඇතිව එක තැනකට එක් වෙමින
තනිකම කාන්සිය පාළුව දුරු කෙරුණ
හද බැඳි ගීය විය අප හෙළ දරු වරුණ

විඳගන්නට නැතිව සිරියා අපේ රටේ
දරුවන් සිත දුකින් විටකදි හඬා වැටේ
ජනකවි නැටුම් බෙර හඬ දී හතර වටේ
සැනසුම ඇති කරමු දරුනට සිටින රටේ

එක වේදිකාවක රඟ දෙන අප දරුවෝ
බහ තෝරන්න කලිනුත් හරි සුරු විරුවෝ
වැඩිහිටි කාගෙනුත් සුබ පැතුමන් ලැබුවෝ
ලොව හැම දෙසම බැබළෙති අප හෙළ දරුවෝ

දුර ඈතක තබා ලස්සන රටයි දැයයි
දියුණුව සොයා පිම්මේ යන අපේ ළමයි
මොහොතක් නැවතිලා සැනසුම් සුවය ලබයි
හෙළ දරු වරුණ පෙන්වන්නේ අපේ කමයි

♦ ***කුමාරි විජේරත්න***
Hounslow Middx **UK**

AUTUMN

A joyful riot of colours
Prelude to winter gales and freezing mists
Hues of scarlet, yellow, russet, brown, gold
Pattern the leaves in carnival mood
To frolic like dervishes, in the wind

♦ **Denis Jansz** London **NW8**

මා හැර ගිය හිමිට

එළිවෙනවා රෑ වෙනවා වෙනසක් නෑ දැනෙන් නේ
සඳ එළියෙන් මඳ පවනෙන් හිමි ගැන මම අහන් නේ
ඇයි අම්මේ අප්පච්චි මා බලන්න නොඑන් නේ
දියණි අහනවා කොහොමද පිළිතුරු මා සොයන් නේ

කඳුළු සිඳී නැති දෙනෙතම පාර දෙසට දුවන වා
නුහුරු රුවක් දකින විටදි ඔබ එනවයි සිතන වා
වරද කිමද පිටව යන්න මම මගෙන්ම අහන වා
සිහිති දියණි ගැන හිතලා ගෙදර එන්න කියන වා

සොඳුරු යුගය මට මතකයි ඔබ එය අමතක කළාට
කුඩුවෙලා අපි හිටියේ කුරුළු ජෝඩුවක් ගානට
ගල් ගැහුවේ වස්වැදුණේ කොහොමද යනු නොදැනු නාට
සෙනෙහස මගෙ අඩුවක් නෑ ඉන්නම් මම පෙර විදි යට

සැප සම්පත් මට මොකටද හිමියන් නැති මේ ගේ තුළ
තනි යහනේ මම සැතපෙමි දරමින් එන රුදු සීතල
නුඹේ උණුසුම තවම දැනේ එය ඇත්තේ මා හද තුළ
මගෙ හිමියන් ගෙදර එන්න රැකගමු අපි අපේ පවුල

සොඳුරු දෙවොල අඳුරු වෙලා පුදසුන මල් පරව යනව
පහන නිවුණ හා ගානයි මුළු නිවසම අඳුරු වෙනව
පුංචි දියණි අසනීපෙන් අප්පච්චි කෝ අහනව
මොනව කරන්නද නොදනිමි මුළු දිවියම මම අඬනව

♦ ***ධම්මිකා තෙන්නකෝන්***
Nicosia Cyprus

මිලින සෙව්වන්දිය

අහෝ සෙව්වන්දිය!
ඔබ සුන්දරත්වය මිලිනය
මොරදෙන කුණාටු රැයෙහි
සරන අදිසි කීටයා
සොයාගති ඔබ යහන
සහවන රහස් ආලයෙහි
උණුසුම ප්‍රමෝදය
නසාලයි ඔබ දිවිය

(William Blake ගේ The sick Rose නමැති පද්‍යය ඇසුරෙනි)

සේපාලිකා ජයසිංහ
Middx UK

♬ ♬ ♬ ♬ ♬ ♬ ♬ නිවාඩුව අවසන් !

ඉර අවරට බහින කලට
සයුරු තෙරක හුදකලාව
සිටිනා විට දැනුණු සුවය
තවමත් ඇත මගෙ සිතතුළ

යනවිට මග සීගිරියට
පින්නවලදි අලි පැටවුන්
කළ දහ වැඩ සිහිවන විට
මසිතට දැනෙනා සිනහව

සුළං කපොලු මගහරිමින්
සීගිරි ලලනාවන් මැද
ගතවුණු අඩ හෝරාවේ
මමත් රජෙකි සිතුනෙමි මට

දළදා සමිඳුන් වඳිමින්
නුවරක අසිරිය දකිමින්
තේවතුවල පහස මැදින්
යාලට ගිය පිය සටහන්

දකුණු ලකේ අග නගරය
ගාලු පුරය පසුකරමින්
කොලම්පුරය පසුකරමින්
මීගමුවට ආවෙමි මම්

නිවාඩුවත් හෙට අවසන්
සොඳුරු මතක තුරුළුකරන්
සීතල කළුවර රටකට
හෙට මම යනවා
එහෙනන්!

♦ ***මහින්ද ගමගේ***
London N22